සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2020 ජනවාරි

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම

(Business Law and Ethics)

2020-01-18
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*

*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න දහය (10) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.7 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් (Fundamental Rights) නඩු සම්බන්ධයෙන් අනන්‍ය අධිකරණ බලය (exclusive jurisdiction) ඇති අධිකරණය වන්නේ:

(1) අභියාචනාධිකරණයයි.
(2) ශ්‍රේෂ්ඨාධිකරණයයි.
(3) දිස්ත්‍රික් අධිකරණයයි.
(4) මහේස්ත්‍රාත් අධිකරණයයි.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය තෝරන්න:

(1) තේසවලාමෙයි නීතිය ශ්‍රී ලංකාවේ විශේෂ නීතියකි.
(2) ශ්‍රී ලංකාවේ පොදු නීතිය වන්නේ රෝම ලන්දේසි නීතියයි.
(3) අපරාධ නඩු සම්බන්ධයෙන් මුල් අධිකරණ බලය පවතින්නේ මහේස්ත්‍රාත් අධිකරණයටයි.
(4) ඉහත සඳහන් සියල්ලම.

**1.3** විකිණීමේ ගිවිසුමට එළඹීමෙන් පසු විකුණුම්කරු විසින් නිපදවනු ලබන හෝ අත්පත් කරගනු ලබන භාණ්ඩ වන්නේ:

(1) අනාගත භාණ්ඩයි. (2) පවත්නා භාණ්ඩයි.

(3) නිශ්චිත භාණ්ඩයි. (4) අවිනිශ්චිත භාණ්ඩයි.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, සාංගමික ව්‍යවස්ථාවේ (Articles of Association) ඇතුළත් කරනු **නොලබන්නේ** කුමක් ද?

(1) සමාගමේ අරමුණු.

(2) සමාගමේ කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්.

(3) සමාගමේ කළමනාකරණය සහ පරිපාලනය.

(4) අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත.

**1.5** පහත සඳහන් ප්‍රචාරණ දැන්වීම (advertisement) පුවත්පතක පළකර තිබුණි:

**" මෝටර් කාර් රථයක් විකිණීමට තිබේ. වැඩි පාවිච්චියක් නොකළ, ඉතා හොඳ තත්ත්වයේ තිබේ.
මිල රු.3,600,000/- කි."**

ගිවිසුම් නීතිය අනුව, මෙය:

(1) විකිණීම සඳහා අර්පණයකි. (2) අර්පනය සඳහා කරන ආරාධනයකි.

(3) අර්පණයක් අවසානයට පත්වීමකි. (4) ප්‍රතිග්‍රහණයකි.

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් (negotiable instrument) **නොවන්නේ** කුමක් ද?

(1) මුදල් ඇණවුම. (2) පොරොන්දු නෝට්ටු.

(3) විනිමය බිල්පත්. (4) චෙක්පත්.

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, නියෝජිතයෙකුගේ වගකීමක් **නොවන්නේ** කුමක් ද?

(1) නියෝජිතයා, ප්‍රධානියාගේ උපදෙස් පිළිපැදිය යුතුය.

(2) නියෝජිතයා ගිවිසුම ඉටුකිරීමේදී උද්යෝගයෙන් කටයුතු කළ යුතුය.

(3) නියෝජිතයා රහස්‍ය ලාභයක් ලබාගත යුතුය.

(4) නියෝජිතයා සැලකිලිමත්වීමෙන් හා නිපුණතාවයෙන් විය යුතුය.

*අංක 1.8 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.8** භාණ්ඩ විකිණීමේ ආඥා පනතට අනුව ව්‍යංග කොන්දේසි (implied conditions) දෙකක්(02) සඳහන් කරන්න.

**1.9** ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ (Securities and Exchange Commission) කාර්යයන් දෙකක්(02) සඳහන් කරන්න.

**1.10** අන්තර්ජාතික වෙළඳාමේ භාවිත කරනු ලබන ගෙවීම් ක්‍රම දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 20)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### 02 වන ප්‍රශ්නය

**පෙරේරා** සහ **සොයිසා,** ලිපිද්‍රව්‍ය අයිතම මිලදීගෙන විකිණීමේ හවුල් ව්‍යාපාරයක නියැලී සිටියි. ඔවුන් අතර හවුල් ව්‍යාපාර ගිවිසුමක් නොතිබෙන අතර, හවුල් ව්‍යාපාරයේ කටයුතු මෙහෙයවීම සඳහා 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ විධිවිධාන ඔවුහු අනුගමනය කරති. **සොයිසා** විසින් ලිපිද්‍රව්‍ය අයිතම ප්‍රමාණයක් වෙළෙඳපොළ මිලෙන් 50% ක වට්ටමක් සහිතව මිලදීගෙන තිබුණි. එම අයිතම, **සොයිසා** විසින් වෙළෙඳපොළ මිලට හවුල් ව්‍යාපාරයට විකුණා එම ගනුදෙනුවෙන් ලාභයක් උපයා ගත්තේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සොයිසා** විසින් ඉහත ගනුදෙනුවෙන් උපයන ලද ලාභය අයකර ගැනීමට හවුල් ව්‍යාපාරයට හිමිකම් තිබේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### 03 වන ප්‍රශ්නය

ගණකාධිකාරිවරයෙකු කවර අංශයේ සේවයේ නිරතව සිටින්නේදැයි නොසලකා, අපක්ෂපාතීත්වය පවත්වා ගනිමින් වෘත්තීය ආචාරධර්ම මාර්ගෝපදේශයන්ට පක්ෂපාතීව කටයුතු කළයුතු වන්නේය. ඔහු එසේ කිරීමට අපොහොසත් වුවහොත්, ආචාරධර්ම කඩකිරීම්වලට අදාළ ප්‍රතිවිපාකයන්ට මුහුණපෑමට සිදුවිය හැකිය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සංවිධානයක ගණකාධිකාරිවරයෙකුට මුහුණ පෑමට සිදුවියහැකි ආචාරධර්මීය ගැටළු (ethical issues) පහක්(05) **සඳහන් කරන්න.** (ලකුණු 05)

### 04 වන ප්‍රශ්නය

අන්තර්ජාතික වෙළඳාම යනු රටවල් දෙකක් අතරේ හෝ රටවල් දෙකක පුද්ගලයන් අතරේ සිදුවන වෙළඳාමයි. අන්තර්ජාතික වෙළඳාමෙහි වඩාත් වැදගත් ලියවිල්ල වන්නේ නෞභාර පත්‍රයයි (bill of lading).

**ඔබ විසින් කළ යුතු දෑ:**

නෞභාර පතක කාර්යයන් දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### 05 වන ප්‍රශ්නය

**සීමාසහිත ෆාමා සමාගම,** මෝටර් කාර් රථ ආනයනය කර බස්නාහිර පළාත තුළ විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටී. සමාගම, එහි ව්‍යාපාරික කටයුතු අනෙකුත් පළාත්වලටද ව්‍යාප්ත කිරීමට සැළසුම් කරමින් සිටී. **සීමාසහිත ෆාමා සමාගමේ** නියෝජිතයෙකු ලෙස **රවී** පත්කිරීම පිළිබඳව **සීමාසහිත ෆාමා සමාගමේ,** ප්‍රධාන විධායක නිළධාරී, ඔහු සමඟ සාකච්ඡා කළේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රධානියා සහ නියෝජිතයා අතර සම්බන්ධතාවය පැන නගින ආකාර තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### 06 වන ප්‍රශ්නය

බිල්පතක යථාකාල ධාරකයා (a holder in due course) යනු එම බිල්පතෙහි දෝෂ පිළිබඳව දැනුමකින් තොරව, බිල්පතට හිමිකමක් නොමැති හෝ දෝෂ සහිත හිමිකමක් ඇති තැනැත්තෙකුට බිල්පත වෙනුවෙන් අගනා ප්‍රතිප්ඨාවක් ගෙවා සද්භාවයෙන් යුතුව බිල්පත දරා සිටින ධාරකයා වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

බිල්පතක යථාකාල ධාරකයෙකුවීමට සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 07 වන ප්‍රශ්නය

**කසුන්** සහ **මායා** අතර, ව්‍යාපාරික ගනුදෙනුවක් මත **කසුන්, මායාගෙන්** රු. මිලියන 1 ක ණයක් ලබාගෙන තිබේ. කෙසේවෙතත්, **කසුන්ගේ** ව්‍යාපාරික පිරිවැටුම පහත වැටීම නිසා ණය මුදල පියවීමට වර්ෂයක කාලයක් ලබාදෙන ලෙස ඔහු **මායාගෙන්** ඉල්ලා තිබේ. **කසුන්ගේ** ජීවිතය සම්බන්ධයෙන් ජීවිත රක්ෂණ ඔප්පුවක් ඇයට ලබාගත හැකිනම්, ඉල්ලා ඇති කාලය ලබාදීමට **මායා** සළකා බලමින් සිටී.

තවද, **මායාගේ** ස්වාමි පුරුෂයා වන **සේන** ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබාගෙන තිබූ අතර, මෑතකදී ඔහු බරපතල හෘදයාබාධයකට ගොදුරු වී ශල්‍යකර්මයකටද භාජනය විය. කෙසේවෙතත්, එම කාරණය රක්ෂණ ඔප්පුව ලබා ගැනීමේදී රක්ෂණ සමාගම වෙත අනාවරණය කර නොතිබුණි. රක්ෂණ ඔප්පුව ලබාගැනීමෙන් පසුව හෘදයාබාධයක් නිසා **සේන** අභාවප්‍රාප්ත විය. **මායා,** රක්ෂණ සමාගමෙන් රක්ෂණ වන්දිය ඉල්ලා සිටියාය. ඒ අවස්ථාවේදී **සේන** හෘදයාබාධ සහිත රෝගියෙකු බව රක්ෂණ සමාගමට දැනගන්නට ලැබී තිබීම නිසා රක්ෂණ සමාගම රක්ෂණ වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කළේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **මායාට, කසුන්ගේ** ජීවිතය සම්බන්ධයෙන් ජීවිත රක්ෂණ ඔප්පුව ලබාගත හැකිදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(b) **මායා** විසින් ඉල්ලා ඇති රක්ෂණ වන්දි හිමිකම් පෑම, රක්ෂණ සමාගමට ප්‍රතික්ෂේප කළ හැකිදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

### 08 වන ප්‍රශ්නය

(a) සේවා ගිවිසුම්වලදී සේව්‍ය සේවක සබඳතාවය පැන නගී. අනෙක් අතට, සේවා සඳහා වන ගිවිසුමකදී සේව්‍යයා සහ නිදහස් ගිවිසුම්කරු සබඳතාවය පැන නගී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සේවකයෙකු, නිදහස් ගිවිසුම්කරුවෙකුගෙන් වෙන්කර හඳුනා ගැනීමට ඇති පරීක්ෂණ තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) **වන්මුගම්** 2002 ජනවාරි 01 දින සමාගමකට බැඳුණ අතර, ඔහුගේ මුල්ම මාසික වැටුප රු.50,000/- ක් විය. දැන් **වන්මුගම්** සමාගමේ ප්‍රධාන විධායක නිළධාරියා වන අතර, ඔහුගේ මාසික වැටුප රු.500,000/- කි. කෙසේවෙතත්, 2020 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි **වන්මුගම්** ඔහුගේ ඉල්ලා අස්වීම බාර දුන්නේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සේවයෙන් අස්වන දිනට **වන්මුගම්ගේ** පාරිතෝශික හිමිකම (gratuity entitlement) **ගණනය කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 09 වන ප්‍රශ්නය

(a) මුදල් විශුද්ධිකරණය (money laundering) යනු නීත්‍යානුකූල නොවන ක්‍රියාකාරකම්වලින් උපයන මුදල් ඒවා නීත්‍යානුකූල නොවන ආරම්භය වසන් කිරීම සඳහා විධිමත් මූල්‍ය ක්‍රමයට හඳුන්වාදීමේ වංචනික ක්‍රමයයි. මෙම ක්ෂේත්‍රය ආවරණය කිරීම සඳහා 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත ශ්‍රී ලංකාව හඳුන්වා දී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනත යටතේ ආවරණය කෙරෙන වැරදි (නීති විරෝධී ක්‍රියා) පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

(b) 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත යටතේ හඳුනාගෙන ඇති බුද්ධිමය දේපළ වර්ග බොහොමයක් ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

බුද්ධිමය දේපළ පනත යටතේ හඳුනාගෙන ඇති පහත සඳහන් දෑ **පැහැදිලි කරන්න**:

(i) ලකුණු (Marks).

(ii) වෙළෙඳ නාම (Trade Names). (ලකුණු 05)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

## <u>D කොටස</u>

අනිවාර්ය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

### 10 වන ප්‍රශ්නය

(A) පෞරාණික බඳුන් (antique pots) එකතු කිරීමෙහි උනන්දුවක් දක්වන **දසුන්** එබඳු බඳුන් වෙන්දේසියක් පිළිබඳව සති අන්ත පුවත්පතක වෙළෙඳ දැන්වීමක් පළ කර තිබෙනු දකී. වෙන්දේසිය, ජූනි මස මැදදී කොළඹදී පැවැත්වීමට නියමිතව තිබුණි. **දසුන්** එම දිනවලදී ඔහුගේ හොඳම මිතුරිය වන **සාරා** සමඟ යුරෝපයේ චාරිකාවක් සැලසුම්කර තිබූ අතර, වෙන්දේසිය කෙරෙහි තිබූ ඔහුගේ උද්යෝගය නිසා චාරිකාව අවලංගු කිරීමට තීරණය කළේය. වෙන්දේසි කිරීමට ලැයිස්තුගත කර තිබූ අයිතම අතර සඳහන් කර තිබූ වටිනා පුරාතනික බඳුනක් සඳහා ලංසුවක් තැබීම සඳහා වෙන්දේසියට පැමිණීමට ඔහු ගාල්ලේ සිට කොළඹ බලා පැමිණියේය. බලාපොරොත්තු පුරවාගෙන වෙන්දේසිපලට පැමිණි **දසුන්ට** දැකගතහැකි වූයේ නොවැළැක්විය හැකි හේතුවක් නිසා වෙන්දේසිය අවලංගු කළ බවට අලවා තිබූ දැන්වීමකි. **දසුන්ගේ** බලාපොරොත්තු සුන්වූ අතර, වෙන්දේසිකරුට එරෙහිව නිත්‍යානුකූලව කටයුතු කිරීමට ඔහුට අවශ්‍ය විය.

මේ අතර, **සාරා**, යුරෝපයට යාමට ඇගේ සැලසුම තනිවම ක්‍රියාත්මක කිරීමට තීරණය කළාය. ඇය කොළඹ පිහිටි ප්‍රසිද්ධ සංචාරක සමාගමක් හරහා ඇයගේ ගුවන් ටිකට්පත සහ නවාතැන් වෙන්කරවා ගත්තාය. ඔවුන් **සාරාට** දන්වා සිටියේ ඇය සඳහා ව්‍යාපාරික පංතියේ ගුවන් ටිකට්පතක් ලබාගත් බව හා නගර මධ්‍යයේ සිට මීටර් 500 ක දුරින් පිහිටි තරු හතරේ හෝටලයක නවාතැන් පහසුකම් සූදානම් කර ඇති බවයි. එම ස්ථානය ඇය සඳහා වෙන්කිරීමට පෙර හෝටල් කාමරයේ ඡායාරූප ඇය වෙත විද්‍යුත් තැපැලෙන් එවා තිබුණි. කෙසේවෙතත්, ඇය දුටුවේ සංචාරක සමාගම වැරදීමකින් පිරිමැසුම් පංතියේ (economy class) ගුවන් ටිකට්පතක් ඇයට වෙන්කර තිබූ බවත් හෝටල් කාමරය නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 5 ක් පමණ දුරින් පිහිටි එකක් බවත්, ඇයට එවා තිබූ ඡායාරූපවලට ගැලපෙන හෝටල් කාමර නොතිබූ බවත්ය. මෙම වැරැද්ද හේතුවෙන් ඇයට වැඩිපුර යූරෝ (Euro) 5,000 ක් වියදම් කිරීමට සිදු විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **විමසන්න**:

(a) **දසුන්** සහ **වෙන්දේසිකරු** අතර, වලංගු ගිවිසුමක් තිබේද යන්න. (ලකුණු 08)

(b) සංචාරක සමාගම සම්බන්ධයෙන් **සාරාට** තිබෙන නෛතික හිමිකම් සහ ප්‍රතිකර්ම පිළිබඳව. (ලකුණු 10)

(B) **ඩේවිඩ්, පෙරේරාගේ** මෝටර් කාර් රථය සොරකම් කර **රොනාල්ඩෝ** ට එය විකුණූ අතර, **රොනාල්ඩෝ** එහි වටිනාකම ගැන සද්භාවයෙන් සිතා මිලදී ගත්තේය. ඊට පසු **රොනාල්ඩෝ** එය **සිල්වාට** විකුණුවේය. මාස කීපයකට පසු පොලිසිය විසින් වාහනය අල්ලා එහි නියම අයිතිකරුට ආපසු දුන්නේය. **සිල්වා** විසින් ගෙවන ලද මුදල් **රොනාල්ඩෝ** විසින් ආපසු දුන් අතර, ඔහු ගෙවූ මුදල් අයකර ගැනීමට **ඩේවිඩ්ට** එරෙහිව නඩු පැවරුවේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**ඩේවිඩ්ගෙන්** මුදල් අයකර ගැනීමට **රොනාල්ඩෝට** හිමිකම් (entitled) තිබේදැයි **විමසන්න**. (ලකුණු 07)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **01 මට්ටම**<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරික්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **02 මට්ටම**<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **03 මට්ටම**<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරික්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරික්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරික්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |